# Journal of Intangible Cultural Heritage

JICH (2026), Volume 5 (I)


# The Social, Cultural, and Economic Background of Kinship: A Revisit to E. R. Leach's Pul Eliya Research on Kinship and Land Tenure in Traditional Sinhalese Society

## ''ඥාතිත්වයේ'' සමාජ, සංස්කෘතික හා ආර්ථීක පසුබිම (සාම්ප්‍රදායික සිංහල සමාජයේ ඥාති ක්‍රමය හා ඉඩම් භුක්තිය පිළිබඳ ඊ. ආර්. ලීච්ගේ 'පුල් එළිය' පර්යේෂණ ග්‍රන්ථය පිළිබඳ පසු විපරමකි)


K. M. S. Samarasekera and B. A. G. Geethika Balasuriya

Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka.

**kmssamarasekara@sjp.ac.lk*



## *Abstract*

*Family, marriage, and kinship are fundamental to the preservation and maintenance of social order. In particular, the entire social system in traditional societies was largely based on kinship. The main objective of this research is to examine how the social, cultural, and economic relationships based on kinship in traditional Sinhalese society, as described by E. R. Leach (1961), have changed in the present. Traditional Sri Lankan Sinhalese society has undergone significant transformations due to factors such as colonization, urbanization, and globalization. Accordingly, the social organization based on kinship is currently facing a number of challenges. As a result, interpersonal relationships rooted in kinship are gradually disappearing from society. This constitutes the central problem of the study. This research focuses on two Grama Seva Divisions, Pul Eliya and Kalawalpathana, located in the Medawachchiya Divisional Secretariat Division of the Anuradhapura District. A sample of 50 family units—25 from Pul Eliya and 25 from Kalawalpathana—was randomly selected, representing approximately 15% of the total population. Data were collected through interviews (using an interview schedule) and observation. The findings indicate that traditional social organization has undergone substantial change. The transformation from an extended family system in the past to a predominantly nuclear family system in the present has been a major factor contributing to the weakening of kinship ties. Cross-cousin marriage (ævæssa gnāti sahōdara vivāhaya), which was common in the past, has almost completely disappeared today. In earlier times, when a villager committed an offense, punishment was often administered through the caste system. However, with the establishment of the modern legal system, this practice has been eliminated. Marriage, as well as caste, was once a key determinant of land tenure. Today, however, caste hierarchy has largely diminished. Furthermore, there is a growing trend of people moving away from traditional agriculture and migrating to urban areas in search of employment. As a result, maintaining active kinship ties has become increasingly difficult. Based on these findings, several recommendations can be proposed, including promoting awareness of the value of kinship among the younger generation, teaching children the importance of family and relatives, and encouraging renewed engagement with agriculture.*



***Key Words:*** *Kinship, Land Tenure, Family, Westernization, Marriage*

## 1. හැඳින්වීම

පුද්ගලයාට සමාජයේ තනිව වාසය කළ නොහැකි ය. අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා එකිනෙකා අන්‍යෝන්‍ය වශයෙන් බැඳී ඇත. ලෝකයේ මෙන් ම ලංකාවේ මෙකී අන්‍යෝන්‍ය සමාජ සබඳතාව පවත්වා ගැනීම සඳහා මූලික පදනම සකස් වී ඇත්තේ ඥාතිත්වය මඟිනි. සමාජ සංස්ථා, සමූහ හා ආයතනවල සබඳතා එමඟින් නිර්මාණය වේ. ඥාතිත්වය, පුද්ගල අන්තර් සහයෝගීතාව වර්ධනය කරනු ලබයි. සිංහල ඥාති ක්‍රමය ක්‍රියාත්මක වූ විසිවන සියවසේ 70 දශකයට පෙර පැවති ලාංකේය ගමක ජීවත් වූයේ එකිනෙකාට සමීපව ඥාතීන් වන පිරිසකි. මේ නිසා සමාජ අනුකලනයක් මොවුන් අතර පැවතිණි. ඥාතීත්වයේ පදනම පවුල හා විවාහයයි. පුද්ගල ජීවිතයේ තීරණාත්මක අවස්ථා පදනම් කරගත් ද්වාරකර්ම චාරිත්‍ර පවත්වන්නේ ඥාතිත්වය හරහා යි. ඊ. ආර්. ලීච් සඳහන් කරන ආකාරයට සිංහල සමාජයේ පරම්පරා ගණනාවක් මුළුල්ලේ විවාහය හා පදිංචිය සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන රටාව ඔවුන්ගේ දේපළ බෙදී යාමට ද සෘජුව ම සම්බන්ධ වේ. මෙකී උරුමය සිදු වන්නේ නෑකම් පද්ධතියක් තුළ ය (Leach, 1961, p. 98). පුද්ගල අනන්‍යතාව ඥාතිත්වය මත තීරණය විය. අයිතිවාසිකම්, යුතුකම් සහ දේපළ සඳහා ඔහුට ඇති අයිතිය, ලිංගික සබඳතා, වාසස්ථාන, උරුමය, පරම්පරාව, විවාහය ආදී සියල්ල තීරණය වූයේ ඥාතිත්වය හරහා යි.

සාම්ප්‍රදායික ලාංකේය සමාජයේ සමාජ සංවිධානය පිළිබඳව මූලාශ්‍රය සපයන සෙල්ලිපි හා ලෙන් ලිපිවලට අනුව මෙන් ම ලීච් පෙන්වා දෙන ආකාරයට ද ගම්සභා, වරිගසභාවල ක්‍රියාකාරීත්වය සුවිශේෂ වේ. ගම්සභාවල මූලික කාර්යය වූයේ වාරිමාර්ග කටයුතු පාලනය කිරීම ය (Mahamadachchi, 2019) . ඊට අමතරව වැව හා ඇළවේලි නඩත්තු කිරීම, නීති කඩ කරන්නන්ට විරුද්ධව කටයුතු කිරීම, ගමේ පන්සල්/ පාරවල්/ අම්බලම් ආදිය නඩත්තුව, ජලය කලට වේලාවට බෙදා දීම, වාරිමාර්ග පාලනයට අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම, ගම්වැසියන් අතර ඇති වන සුළු ආරවුල්වලට මැදිහත් වීම, වාර්ෂිකව අස්වැන්න අධීක්ෂණය කිරීම හා ඒවා වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම, කුඹුරු ඉඩම් මැන අයිතිකරුවන්ගේ සීමා දැක්වීම ද සිදු කර ඇත (Codrington, 1938). මේවා සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වූයේ ඥාති සබඳතා ඔස්සේ යි. යටත්විජිත පාලකයින්ගේ බලපෑම මත වරිගසභා හා ගම්සභාවල ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය වෙනස් විය (Leach, 1961. 101 p). මේ ආකාරයට සිංහල සමාජයේ ඥාතිත්වය හා ඉඩම් භුක්තිය අතර සම්බන්ධය පිළිබඳ ඊ. ආර්. ලීච් (E. R. Leach) විසින් උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පුල් එළිය ග්‍රාමයේ 1954 දී සිදු කළ අධ්‍යයනය ඇසුරින් රචිත *Pul Eliya* (පුල් එළිය) ග්‍රන්ථයේ ඉතා හොඳින් විවරණය කර ඇත (Mapa, 2002) (Stein, 1968). මේ තත්ත්වය වර්තමානය වනවිට කිනම් ආකාරයක වෙනස් වීමකට ලක් වී ඇත්දැයි අධ්‍යයනය කිරීම වටින්නේ ය.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය විවරණාත්මක පර්යේෂණයක් වශයෙන් හැඳින්විය හැකි ය. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් උතුරු මැද, අනුරාධපුර, මැදවච්චියේ, අතීතයේ පුල් එළිය ගම්මානය වශයෙන් පැවති වර්තමාන කලවැල්පතාන සහ පුල් එළිය ග්‍රාම සේවා වසම් යොදාගත් අතර සමස්ත ගහණය වූ නිවාස 237න්, ආසන්න වශයෙන් 20%ක් නියෝජනය වන ලෙස නිවාස පනහ (50)ක් අහඹු නියැදි ක්‍රමය මගින් තෝරාගෙන නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් ඔස්සේ දත්ත රැස් කරන ලදි (2024 ජූනි - අගෝස්තු). එහි දී රැස්කරගත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත මිශ්‍ර ක්‍රමයක් භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයනය කළ පවුල් ඒකක අතරින් වැඩිම සාමාජිකයන් සංඛ්‍යාවක් (09)ක් දක්නට ලැබුනේ නිවාස 3%ක් තරම් අඩු ප්‍රමාණයක යි. සාමාජිකයින් හයක් හෝ හතක් සිටි පවුල් කිහිපයක් කලවල්පතානෙන් පමණක් හමු විය. සාමාජිකයින් තිදෙනෙකු පමණක් සිටින පවුල් ආසන්න වශයෙන් 12%කි. මේ අනුව බහුතරයක් පවුල් ඒකකයන්හි සාමාජිකයින් හතර දෙනෙක් සිටීම පොදු ලක්ෂණයකි. ලීච් පුල් එළිය පිළිබඳ අධ්‍යයනය කරන සමයේ එක ම ගමක් වශයෙන් පැවතිය ද පසුව ගම සීමාවේ සිටි සේවා කුල කිහිපයකින් විකාසනය වී වර්තමාන කලවැල්පතාන ගම බිහි වී ඇති බව කිව යුතු ය.

කෙතරම් නවීකරණයට ලක් වුව ද සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන පුද්ගලයන් වැඩි ප්‍රතිශතයකට ඉහළ අධ්‍යාපන මට්ටමක් නො තිබීම පුල් එළියට ද පොදු තත්ත්වයකි. කෙසේ වුවත් කිසියම් අවම මට්ටමක හෝ අධ්‍යාපනයක් නොලද අය සිටින්නේ සුළු වශයෙනි. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන් 44%කි. එය වැඩි ම ප්‍රතිශතය යි. උසස් පෙළ දක්වා අධ්‍යාපනයේ නිරත වූවන් ද සැලකිය යුතු මට්ටමක පසුවන නමුත් උසස් අධ්‍යාපනය ලබන්නන් සහ ලැබූවන් සිටින්නේ 7% ක තරම් කුඩා ප්‍රමාණයකි. ගැහැනු පිරිමි භේදයකින් තොරව විධිමත් අධ්‍යාපනයක් ලැබීමට නැඹුරු වුව ද බහුතරයක් අ. පො. ස. සාමාන්‍ය පෙළින් පසු අධ්‍යාපනය හැර යයි.

පුල් එළියේ ජීවනෝපායන් පිළිබඳ විමසීමේ දී දැකගත හැකි වූයේ සාපේක්ෂව රාජ්‍යය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ සුළු රැකියාවක් හෝ කිරීමට යොමු වී ඇති අන්දමයි. එය පිළිවෙළින් 30% හා 24%ක අගයකි. රාජ්‍යය අංශයේ රැකියා නියුක්තියෙන් අඩකට ආසන්න පිරිසක් නිරත වන්නේ හමුදා සේවයේ යි. කෙසේ නමුත් අතීතයේ සිට පැවත එන කුඹුරු හා හේන් ගොවිතැන වර්තමානයේ දී ද පුල් එළිය ග්‍රාමයේ බොහෝ පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය වෙයි. සමස්ත නියැදියෙන් 46% ක ප්‍රමාණයකි. මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් සුළු පිරිසක් ද සිටි අතර කෙමෙන් එය සමාජයෙන් ඈත්ව යන ජීවනෝපායක් ලෙස නිරීක්ෂණය විය.

අධ්‍යයන ප්‍රදේශයේ 60%ක් උපන් දා සිට මෙහි පදිංචි වී සිටින්නන් ය. ඥාතිත්ව උරුමයෙන් හිමි වූ පරම්පරානුගත ඉඩම්වල මොවුන් වාසය කරයි. විවාහය නිසා පුල් එළියට පැමිණි පිරිසක් (30%) ද සිටි අතර එයින් අඩකට ආසන්න පිරිසක් බින්න විවාහය හේතු කොටගෙන ගමේ පදිංචි වූවන් ය. නියැදියේ 4%ක ප්‍රමාණයක් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසාත්, රැකියාව හේතුවෙන් 6%කුත් ගමට පැමිණ ඇත.

පවුල් ඒකකයක් තුළ පරම්පරා කිහිපයකට අයත් සාමාජිකයින් ජීවත් විය හැකි ය. එය පවුලේ ස්වභාවය තීරණය කරයි. සංකීර්ණ න්‍යෂ්ටික පවුලක දෙමාපියන් හා දරුවන්ට අමතරව තවත් එක් පුද්ගලයෙක් හෝ දෙදෙනෙක් ජීවත් වූහ. විස්තෘත පවුලක පරම්පරා තුනක සාමාජිකයින් එක ම ඒකකයක් ලෙස ජීවත් වීම දක්නට ලැබිණි. මෙම ප්‍රදේශයේ වර්තමානයේ වැඩි වශයෙන් දැකගත හැක්කේ න්‍යෂ්ටික පවුල් (72%) හා සංකීර්ණ න්‍යෂ්ටික පවුල් (24%) වන අතර විස්තෘත පවුල් දෙකක් පමණක් දැකගත හැකි විය.  පුල් එළිය පිළිබඳ ලීච් අධ්‍යයන කළ කාල සීමාවේ (1954-1955) වැඩි වශයෙන් දක්නට ලැබුනේ විස්තාරිත පවුල් ය. සමස්ත නියැදියේ පවුල් 50න් 12ක් ම පරම්පරා 3ක අය එකට ජීවත් වන ඒවා වුව ද ඒවායෙහි විස්තෘත පවුල් ස්වභාවයක් නො තිබුණි. ලීච් පුල් එළිය ග්‍රන්ථයේ ගෙනහැර දක්වන ආකාරයට සිංහල සමාජයේ අනන්‍ය ස්වභාවයක් වූයේ මහගෙදර තත්ත්වය යි. වත්මන් පුල් එළියේ මහගෙවල් හමු වූයේ ඉතා සුළු වශයෙනි.

පරම්පරා තුනක් වසන ගෘහයක වැඩිමල් ම පරම්පරාව විසින් පවුලේ තීරණ ගැනීම, වගකීම් දැරීම දේපළ අයිතිය හා පරිහරණය ආදී තත්ත්වයත්වයන්හි දී මූලිකත්වය ගනියි නම් එය මහගෙදරකි. විවාහක යුවලක් (එක් දරුවෙක් සමග), එම කාන්තාවගේ දෙමාපියන් සහ සහෝදරිය ඇතුළත්ව පරම්පරා තුනක් ජීවත් වන එක් පවුලක් පුල් එළියේ දී ද එමෙන් ම ආච්චි, සීයා, මව, පියා, විවාහක පුත්‍රයා, ඔහුගේ බිරිඳ හා ඔවුන්ගේ දරුවන් සිටින පරම්පරා 4කින් යුතු පවුලක් කලවැල්පතාන ගමෙන් ද හමු විය. පවුලේ තීරණ ගැනීම් සම්බන්ධයෙන් මුල් වන්නේ පළමු පරම්පරාවේ පිරිමියා යි. නමුත් ඔවුහු හැකි ඉක්මනින් දෙමාපියන් හා සහෝදරියගෙන් වෙන්ව වෙනම වාසය සඳහා යාමට සැලසුම් කරමින් සිටිති. මේ සම්බන්ධයෙන් ගෘහමූලික පුද්ගලයා පැවසුවේ, **"රස්සාවල් එක්ක දරුවොන්ට හැමදාම මෙහෙ ඉන්න බෑ. දේපළ පවරලා දීලා තිබුණත් එයාලා මෙහෙ ඉන්න කැමති නෑ. මහගෙදර විතරක් ඉතිරි කරලා අනිත් ඉඩකඩම් දේපළ සල්ලි කරගන්න තමා එයාලගෙ බලාපොරොත්තුව"** යනුවෙනි.

බොහෝ විට වර්තමානයේ පවුලේ තීරණ ගැනීමේ අයිතිය වැඩිහිටි පරම්පරාවට නො ලැබෙයි. තරුණ පරම්පරාව ඒ සඳහා වැඩි කැමැත්තක් නො දක්වයි. ඔවුන් එය සලකන්නේ තම නිදහස සීමා වීමක් ලෙසය. ඒ අනුව වත්මන් සිංහල සමාජයේ විවාහක දරුවන් සමඟ දෙමාපියන්ට අතීතයේ තිබූ ගෞරවනීය ප්‍රමුඛස්ථානය ශීඝ්‍රයෙන් ගිලිහෙමින් පවතී. පවුල් ඒකකය තුළ හෝ ඉන් පරිබාහිරව සජීව ලෙස ඥාති සබඳතා පවත්වන පරම්පරා ගණන දෙකකට සීමා වී ඇත. ඇතැම්විට පරම්පරා තුනක් සමඟ සම්බන්ධතා පවත්වන පවුල් ඇත. තරුණ පරම්පරාවේ පොදු මතය

වන්නේ තමන්ට ඉහළ පරම්පරාවල ඥාතීන්ගෙන් ස්වාධීනව තම කටයුතු කරගෙන යාම අවශ්‍ය බව යි. මේ අනුව තම පවුල් ඒකකය තුළ මෙන් ම ඉන් පරිබාහිර අය සමග ඥාති සබඳතා පැවැත්වීම අතීතයේ තරම් සක්‍රීය නොවේ. අනාගතයේ දී තවදුරටත් මෙම සබඳතා ලිහිල් වී යනු ඇත. මන්දයත් කාර්යබහුල දිවියක් ගත කරන වත්මන් පුද්ගලයන් හට බැඳීම් රැක ගැනීම සඳහා වැය කිරීමට තරම් කාලයක් නොමැති වීම යි.

**වත්මන් සිංහල සමාජයේ විවාහය හා පවුල් ජීවිතය පිළිබඳ විමසන විට** අතීතයේ සුලබව පැවති එකගෙයි කෑමේ චාරිත්‍රය අද දක්නට නැත. බින්න විවාහය, එනම් විවාහයට පසු බිරිඳගේ නිවසේ පදිංචි වීම ඉදහිට දක්නට ලැබුණ ද වැඩි වශයෙන් පවතින්නේ ඇවැස්ස ඥාති නොවන දීග විවාහය යි. එනම් සැමියාගේ නිවසේ හෝ වෙනත් නිවසක පදිංචියට බිරිඳ පැමිණීම යි. ලීච් පුල් එළිය ගම අධ්‍යයනය කරන ලද කාල වකවානුවේ බහුලව ම පැවති විවාහ ක්‍රමය වූයේ ඇවැස්ස ඥාති සහෝදර විවාහය යි. වර්තමානයේ ඇවැස්ස ඥාති විවාහය ඉතා සුළු වශයෙන් ඇත. ඉහත දැක්වූ පරිදි පරම්පරා 3ක් හෝ 4ක් පැවති පවුල් ඒකක කිහිපයෙහි ඇති වැඩිහිටි පරම්පරාවල බොහෝ විට මෙම ඇවැස්ස ඥාති විවාහ දක්නට ලැබෙයි. ඔවුන් එලෙස විවාහ වීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ දේපළ බෙදීයාම වළක්වාලීම ය. සමාජ විකාශනයත් සමඟ එකගෙයි කෑම සභ්‍යත්වයකින් තොර විවාහ ක්‍රමයක් ලෙස සලකා වර්තමානයේ දක්නට නො ලැබුණ ද අතීත සිංහල සමාජයේ එය පැවති බව ඔවුහු ප්‍රකාශ කරති.

අතීතයේ තමන් පදිංචි ගමෙන් පිට විවාහ සිදු වූයේ කලාතුරකිනි. එයට හේතුව වරිග සභාව මඟින් බහිර්ජන්‍ය විවාහ පිළිබඳ සීමා පනවා තිබීම යි. විවාහය සඳහා සමාජයේ තහංචි ගණනාවක් පැවතිණි. එමඟින් සමාජ පර්යාය පවත්වා ගත් අතර කුලය එහි දී ප්‍රධාන ස්ථානයක් ගනී. විශේෂයෙන් ම මෙකී තහංචි මඟින් ව්‍යභිචාරයන් සිදු වීම වළකා ගැනීම අරමුණු කොටගෙන ඇත. සාම්ප්‍රදායික සිංහල සමාජයේ ආවාහ විවාහ වෙනත් කුලවලින් සිදු කරනොගත් අතර පුල් එළිය පිහිටි නුවර කලාවියේ විවාහයේ දී වරිගය ද සලකා ඇත. වෙනත් ප්‍රදේශයකින් විවාහයක් සිදු කරගත්ත ද ඔවුන් එක ම වරිගයට අයත් විය යුතු විය. පහත් කුලවලින් විවාහ සිදු කර ගැනීම වරිග තහංචියක් විය. නමුත් වර්තමානය වන විට පහත් යැයි සම්මත කුලවලින් පවා විවාහ සිදු කර ගෙන තිබීම සුලබව දක්නට ලැබිණි. එමෙන් ම ජාතීන් දෙකක අය අතර පවා ආවාහ-විවාහ වර්තමාන පුල් එළිය ග්‍රාමයේ සිදු වන අතර මුස්ලිම් දෙමළ පවුල් 4ක් පමණ එම නිසා ගමෙහි පදිංචි වී සිටී. නියැදිය තුළ ඇවැස්ස ඥාති විවාහය අනුමත කරන පිරිස්, ප්‍රතික්ෂේප කරන පිරිස් මෙන් ම ඒ පිළිබඳ හරි අදහසක් නොමැති පිරිස් ද හඳුනාගත හැකි විය. ඇවැස්ස ඥාති විවාහය පිළිබඳව එකඟත්වය පළ කරන්නන්ගේ අදහස වන්නේ එකිනෙකා හොඳින් දන්නා අයවලුන් වන නිසා ඔවුන් අතර වන බැඳීම් වැඩි බවත්, චාරිත්‍රානුකූල අයිතියක් ඇති බවත් සහ දේපළ පිටට නොයන බවත් ය. දරුවන් රෝගී වීමට ඉඩ ඇති බව අසා තිබුණ ද එසේ වූ අවස්ථා දැකගත නොහැකි වූ බවත් එම නිසා ඇවැස්ස ඥාති විවාහයක් සිදු කිරීම ගැටලුවක් නොවන බවත් ඔවුන්ගේ අදහස විය. ඒ පිළිබඳව විරුද්ධ අදහස් දක්වන්නන් පෙන්වා දෙන්නේ දරුවන් රෝගී හෝ අංගවිකල වීමට මෙම විවාහ ක්‍රමය හේතු වන බවත්, එතුළින් අලුතින් නෑදෑයින් ඇති නොවන බවත්, වර්තමාන සමාජයට එය නොගැළපෙන බවත් ය. එමෙන්ම සමස්ත නියැදියේ ම දත්ත දායකයින් එකගෙයි කෑමේ විවාහ ක්‍රමය අවිවාදයකින් තොරව ම ප්‍රතික්ෂේප කිරීම සිදු කරන ලදි.

අතීත සිංහල සමාජයේ **අවරෝහණය, අනුප්‍රාප්තිය හා උරුමය සිදු වූ ආකාරය විමසන විට** ඉඩකඩම් දේපළ උරුමය මෙන් ම නිලතල, පෙළපත හා පුද්ගල අනන්‍යතාව කෙනෙකුට ලැබුණේ ඥාතිත්ව අවරෝහණය මගිනි. පුල් එළිය ග්‍රාමයේ ඉඩම් උරුමය මව්පිය දෙපාර්ශ්වයෙන් ම එනම් ද්විපාර්ශ්වීය අවරෝහණය යටතේ සිදු වේ. නමුත් පෙළපත (නිරූපණය වන්නේ වාසගම මගිනි) හිමි වන්නේ පිය පාර්ශ්වයෙන් ය. පුල් එළියේ පමණක් නොව සමස්ත සිංහල සමාජයේ ම ඇතැම් සුවිශේෂී අවස්ථා හැරුණු විට අවරෝහණය ද්විපාර්ශ්වීය වෙයි. අධ්‍යයන ප්‍රදේශයේ වාසගමක් සහිත වූවන් මෙන් ම රහිත වූවන් ද වාසය කරයි. සාම්ප්‍රදායික සිංහල සමාජයේ වාසගම ලෙස භාවිත කළේ ගෞරවයක්, නම්බුවක්, තනතුරක් ලෙස හෝ සේවයක් වෙනුවෙන් ලද පාරම්පරිකව එන නාමයකි. ඉතා ම පහළ සේවක කුල සාමාජිකයන්ට වාසගමක් රහිත වූයේ මේ හේතුව නිසයි. ඔවුන් භාවිත කරන්නේ පහළගෙදර ඉහළගෙදර වැනි යෙදුමක් සමග සකසාගත් නාමයකි. ඒ අනුව වාසගම මත කුලය නිරූපණය වන නිසා සමාජයේ ව්‍යුහාත්මක ස්වභාවය තීරණය වන පදනම විය. වර්තමානයේ ද වාසගමක් නොමැති අය 16%ක පමණ පිරිසක් අධ්‍යයන නියැදියෙන් හමු විය.

සාමාන්‍ය සිංහල සමාජයේ බොහෝදුරට දැකිය හැකි වන්නේ පරම්පරා ගණනක් එක දිගට එක ම ආකාරයෙන් වාසගම පවත්වාගෙන යාමයි. පුල් එළියේ මීට වෙනස් තත්ත්වයක් දැකගත හැකි ය. මෙහි දරුවන්ට වාසගම ලෙසින් හිමිවන්නේ දරුවාගේ පියාගේ නමෙහි අගට යෙදෙන නාමය යි. උදාහරණ ලෙස එක් දත්ත දායකයෙකුගේ නම සිරිසේන වේ. ඔහුගේ පුතාගේ නම සිරිසේනගේ බණ්ඩාර වේ. දත්ත දායකයාගේ මුණුබුරාගේ නමෙහි වාසගමට යෙදෙන්නේ බණ්ඩාරගේ යන්නයි. මෙම තත්ත්වය පුල් එළිය ග්‍රාමයට පමණක් සීමා වූවක් නොවේ. සමස්ත නුවර කලාවිය තුළ ම හඳුනාගත හැකි සාමාන්‍ය ලක්ෂණයකි. නමුත් ඇතැම් අවස්ථාවල දී සාමාන්‍ය ආකාරයෙන් පරම්පරා ගණනක් එක දිගට පැවත ආ වාසගම ක්‍රියාත්මක වේ. එනම් සීයාගෙන් පියාටත්, පියාගෙන් පුතාටත් එක ම වාසගම හිමි වේ. උදාහරණ ලෙස තවත් දත්ත දායකයෙකුගේ වාසගම දිසානායක මුදියන්සේලාගේ වේ. එම දරුවන්ගේ පියාගේත්, දරුවන්ගේත් වාසගම දිසානායක මුදියන්සේලාගේ ම ය. එය වෙනස් වීමකට ලක් නොවී දිගින් දිගටම පැවතගෙන එයි. මෙම තත්ත්වයට බලපා ඇත්තේ කුල ධුරාවලියේ පහළ ස්තර නියෝජනය කරන කුල සාමාජිකයන්ට පාරම්පරිකව පැවත එන වාසගමක් නොතිබීමයි. නමුත් වර්තමානයේ මෙම නියමයන් සම්පූර්ණයෙන් වෙනස් වී ඇත. තමන්ට සිතැගි පරිදි නම් වාසගම් භාවිත කරයි.

දේපළ බෙදී යාම ද්විපාර්ශ්වීය අවරෝහණය යටතේ සිදු වේ. දේපළ බෙදී යා යුතු ප්‍රමාණයන් පිළිබඳ අදහස් පවුල් ඒකකයෙන් ඒකකයට වෙනස් වෙයි. ඇතැම් පවුල්වල දරුවන් සියලු දෙනාට ම සම සේ ඉඩම් බෙදා දෙනු ලබයි. ඇතැම් අවස්ථාවක දරුවන්ට ඉඩම් බෙදා දීමේ දී පිරිමි දරුවන්ට වැඩි කොටසක් ලැබෙයි. පුතුන් දෙදෙනෙකු සිටින විට එක් අවස්ථවක දී වැඩිමල් පුතාට ද, තවත් පවුල් ඒකකයක බාල පුතාට ද එම වරප්‍රසාදය හිමි වෙයි. තම දෙමාපියන් රැක බලා ගැනීම වෙනුවෙන් ඔහුට තමා උපන් නිවස සහ වත්ත මෙන් ම කුඹුරුවලින් වැඩි කොටසක් භුක්ති විඳීමට අවස්ථාව හිමි වීම ද දක්නට ලැබෙයි.

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගම්මානයක් වන පුල්එළියේ ඉඩම් භුක්ති ක්‍රමයේ පරිවර්තනය සිදු වීම සඳහා ප්‍රධාන වශයෙන් ම ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යුහයන්ගේ වෙනස් වීම, ලිඛිත නීති නිර්මාණය වීම සහ සමාජ-දේශපාලනික සන්දර්භවල සිදු ව ඇති පුළුල් වෙනස්කම් හේතු වී ඇත. 1960 ගණන්වල දී, පුල්එළියේ ඉඩම් හිමිකම ප්‍රධාන වශයෙන් පාලනය වූයේ විධිමත් නීතිමය ලියකියවිලිවලට වඩා චාරිත්‍ර මූලධර්මවලට අනුව යි. ගමෙහි පැවති කුල ක්‍රමය පදනම් කරගත් ගම්සභා සහ වරිගසභා මෙම සමාජ පර්යාය පවත්වා ගෙනයාමට මුල් විය. පරම්පරානුගතව ඉඩම් උරුම වීමක් මෙම සමාජයේ පැවති අතර වරිගයෙන් පිට ඉඩම් උරුමවීමක් කිසි විටක සිදු වූයේ නැත. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ඇවැස්ස ඥාතී විවාහය මඟින් පරම්පරානුගතව පැමිණ ඇත. එවකට පුල් එළියේ ඉඩම් භුක්තිය මූලිකව ම ඥාතිත්වය මත රඳා පැවතුණේ ඒ ආකාරයටයි. ලීච් පෙන්වා දෙන පරිදි, ඥාතිත්වය යනු හුදෙක් සමාජ කණ්ඩායමක් පමණක් නොව, ඉඩම් සහ වාරිමාර්ග පද්ධති භුක්ති විඳීම සඳහා පවතින යාන්ත්‍රණයකි.

යටත්විජිතකරණය හමුවේ නිර්මාණය වූ කාර්මීකරණය, නාගරීකරණය, ගෝලීයකරණය වැනි සංකල්ප මත සමාජයේ සිදු වූ වෙනස් වීම පුල් එළියේ පැවති සමාජ සංස්කෘතික පසුබිම වෙනස් වීමට හේතු විය. නීතිමය රාමු ගොඩ නැඟීම සහ නිලධාරිකරණ ක්‍රියාවලිය මෙම ගම තුළ ද ක්‍රියාත්මක වීම ආරම්භ වී ඇත. අද වනවිට, බොහෝ ඉඩම් ගනුදෙනු සඳහා ලියාපදිංචි කිරීම, නීත්‍යානුකූල ඔප්පු පැවතීම ආදිය රාජ්‍ය ඉඩම් රෙගුලාසිවලට අනුකූල වීම අත්‍යවශ්‍ය වී ඇත. කුලය මත රඳා පැවති සියලු තීන්දු තීරණ වර්තමානය වන විට නීතියට අනුව සිදු වෙයි. ඉඩම් සංවර්ධන ආඥා පනත හරහා ආරම්භ කරන ලද ඉඩම් භුක්තිය පිළිබඳ සංකල්පය හමුවේ ඥාතිත්වය පදනම් කරගත් අධිකාරීමය ස්වරූපය රාජ්‍ය පාදක නීතිමය හිමිකම දක්වා විකාශනය විය. මෙම වෙනස්වීම මත කවර කුලයකට අයත් වුව ද පරම්පරානුගතව පැවත ආ ඉඩම්වල වුව ද හිමිකම් විධිමත් නීතිමය ලියකියවිලිවලට අනුව උරුම වන අතර එසේ නොමැති පුද්ගලයන්ට තම ඉඩම් සඳහා අයිතිය ප්‍රකාශ කිරීමට ද නොහැකි වී ඇත.

ඉඩම් අයිතිය පිළිබඳ ලියකියවිලි නොමැතිව අයිතිය අපැහැදිලි වූ විට හෝ සහෝදර සහෝදරියන් අතර හිමිකම සඳහා මතභේද පවතින විට ඇතිවන ඉඩම් සම්බන්ධ ගැටලු, විවාහ සම්බන්ධ ගැටලු ගම්සභා වරිගසභා මඟින් විසඳා ගත් අතර වර්තමානයේ ඒ සඳහා උසාවි නිර්මාණය වී ඇත. ගම්සභා, වරිගසභා ක්‍රමයෙන් සමාජයෙන් ඉවත් වී අතුරුදහන් වී ඇත.

1960 ගණන්වල දී, ඉඩම් ආරවුල් උසාවි වෙත ගෙන යන ලද්දේ කලාතුරකිනි. ඒ වෙනුවට, ඒවා ඥාතීන් පදනම් කරගත් සාකච්ඡා, ගමේ වැඩිහිටියන්ගේ මැදිහත්වීම් හරහා විසඳා ගන්නා ලදි. මෙම ක්‍රියාවලිය සමාජ සමගිය ආරක්ෂා කළ අතර පවුලේ සහ ඉඩම්වල අන්තර් සම්බන්ධිතභාවය

පිළිබිඹු කළේ ය. පසුකාලීනව ඉඩම් ආරවුල් විසඳීම සඳහා බොහෝ විට අධිකරණ මැදිහත් වීම හෝ විධිමත් නීතිමය බේරුම්කරණයක් අවශ්‍ය විය. මෙම වෙනස් වීම සාම්ප්‍රදායික අධිකාරී ව්‍යුහවල දුර්වල වීමට සහ සාමූහික ඥාතිත්ව අනන්‍යතාවට වඩා පුද්ගල නෛතික අනන්‍යතාවයේ වර්ධනයට හේතු විය. මෙම වෙනස් වීම සඳහා ඥාතිත්වයේ අවම වීම ද හේතු වී ඇති බව ප්‍රකාශ කළ හැකි ය. ලීච්ගේ පුල්එළිය ග්‍රන්ථය අධ්‍යයනයේ දී ඥාතිත්වය යනු ඉඩම්, ශ්‍රමය සහ බලය තේරුම් ගත් පදනම වශයෙන් අර්ථ ගැන්වීමට හැකි ය. පුල් එළිය ග්‍රාමයේ ඉඩම් යනු සම්පතක් පමණක් නොවේ. එය සබඳතා, චාරිත්‍ර වාරිත්‍ර සහ අයිතිවාසිකම් අන්තර්ගත වූ සමාජ ආයතනයක් වශයෙන් පැවති බව පෙන්වා දිය හැකි ය.

ලීච් පුල් එළිය ග්‍රාමයේ අධ්‍යයනය කටයුතුවල නිරත වූ විසිවන සියවසේ මැද භාගයේ ඉඩම් කැබලි වීම ඉතා අවම මට්ටමකින් පැවතිණි. කෘෂිකාර්මික ඉඩම් බොහෝ විට විස්තෘත පවුල් විසින් කළමනාකරණය කරන ලද අතර, එම නිසා පරම්පරා ගණනාවක් පුරා ඉඩම් එක ම පවුල් ඒකකය තුළ ම පැවතුණි. ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ නිසා ඉඩම්වල අවශ්‍යතාව සමාජයේ ඉතා වටිනා මෙවලමක් විය. ඉඩම් සාමූහිකව පාලනය කිරීම සහ ඥාතිත්වය මඟින් ආර්ථික තිරසාරභාවය අත්පත් කර ගැනීමට මෙමඟින් හැකි විය. ජනගහන වර්ධනය, ආර්ථික පීඩනය සහ ඉඩකඩම්වල උරුමය, රැකියාව හා ගොවිතැන් කටයුතු වත්මන් පරපුරෙන් ඉවත් වීම යන හේතු මත වර්තමානයේ සැලකිය යුතු මට්ටමකින් ඉඩම් කැබලි කිරීම හා විකිණීම සිදු කරයි. සෑම පරම්පරාවක් ම උරුම වූ ඉඩම් කුඩා බිම් කොටස්වලට බෙදා ඇති අතර, එමඟින් කෘෂිකර්මාන්තය සඳහා විවිධ බාධාකාරී තත්ත්ව ඇති වී ඇත. මෙය බොහෝ ගම්වැසියන් කෘෂිකර්මාන්තයෙන් බැහැරව වෙනත් රැකියා සෙවීමට හෝ තමන්ට හිමි වූ කුඩා ඉඩම් කොටස විකුණා වෙනත් ප්‍රදේශයකට පදිංචියට යාම සිදු වෙයි. ඒ අනුව වර්තමානයේ ඉඩම් වෙළඳ භාණ්ඩයක් බවට පත් වී ඇති පසුබිමක ගම තුළ සමාජ විභේදනය වේගවත් වී ඇති අතර විශාල ඉඩම් හිමි අය සහ වගා කළ හැකි ඉඩම් සඳහා අවම හෝ ප්‍රවේශයක් නොමැති අය අතර යම් දූරස්ථභාවයක් නිර්මාණය වී ඇත.

අතීතයේ තිබූ සාර්ථක ස්වයංපෝෂිත ජීවන රටාව නිසා එකිනෙකා අතර අන්තර් සබඳතාව වර්ධනය වූ අතර ඥාතීන් සෑම විට ම එකිනෙකාගේ ආර්ථික මට්ටම ගොඩ නංවාලීමට සාමූහික වශයෙන් ක්‍රියාත්මක වීමක් පැවතිණි. එමෙන් ම මෙහි දී වාරිමාර්ග ක්‍රම ද වැදගත් වූ අතර ගමේ වැව මේ සඳහා යොදා ගැනිණි. ඔවුහු ඒ සියල්ල ඵලදායී ලෙස කළමනාකරණය කළහ. නූතන පුල් එළියේ මෙකී තත්ත්වය බොහෝ දුරට වියැකී ගොස් ඇත. මහා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණවලින් පසුව වාරිමාර්ග දැන් රජය විසින් පත් කරන ලද නිලධාරීන් විසින් නියාමනය කරනු ලබයි.

ඥාති සබඳතා දිගු කලක් තිස්සේ මානව සමාජවල මූලික අංගයක් වී ඇති අතර සමාජ ව්‍යුහයන්, සංස්කෘතික භාවිතයන් සහ පුද්ගල අනන්‍යතා මෙමඟින් නිර්මාණය කරයි. ඊ. ආර්. ලීච් ඔහුගේ කෘතියේ දී, ඥාතිත්වයේ සංකීර්ණතා පිළිබඳ පුළුල්ව ගවේෂණය කර ඇත. එහි දී ඔහු ඥාති සබඳතා නිර්වචනය කිරීමේ දී සමාජ සන්දර්භය සහ සංස්කෘතික භාවිතයන්හි වැදගත්කම අවධාරණය කර ඇත. ඥාතිත්වය යනු හුදෙක් ලේ සබඳතා පමණක් නොව සමාජ බැඳීම්, පුද්ගල සමාජ භූමිකා ද ඇතුළත් බව ඔහු තර්ක කළේ ය. ඉඩම් හිමිකම සහ සමාජ සංවිධානය සමඟ ගැඹුරින් බැඳී ඇති ඥාතිත්ව පද්ධතියක් පුල් එළිය ග්‍රාමයේ පැවතිණි. නමුත් වෙළඳපොළ වර්ධනය, රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය වීම සහ සමාජ ආර්ථික මාරුවීම් මෙම ව්‍යුහය මූලික වශයෙන් වෙනස් කර ඇත. විවාහය ද මේ සඳහා මොවුන් උපයෝගී කරගත් අතර ලේ ඥාති විවාහවලට පරිබාහිර විවාහයන් සිදු වූයේ නැත. පරිබාහිරව විවාහයක් සිදු වුව ද වරිගයෙන් පිට විවාහ සිදු කර ගැනීම තහනම් විය. එවිට පරම්පරානුගත දේපළ වෙනත් පාර්ශ්ව අතරේ බෙදී යාමක් සිදු නො වුණි. වර්තමානයේ මෙකී තත්ත්වය ගමෙහි දක්නට නොමැති අතර ඥාති සබඳතා ඉතා අවම මට්ටමකින් පවත්වා ගැනීමට ඔවුන් යොමු වී තිබේ.

විශේෂයෙන් ඥාතිත්වය මත ගොඩනැගුණු අන්‍යෝන්‍ය බැඳීම් මත පදනම්ව ආර්ථිකය වර්ධනය කර ගැනීම උදෙසා කෘෂිකාර්මික කටයුතු හුවමාරු කර ගැනීම, වැව් නඩත්තු කිරීමේ සිට කෘෂි අස්වැන්න ලබා ගැනීම ඉතාමත් සහයෝගීව සංවිධානාත්මකව සිදු කරන ලදි. නමුත් වර්තමානයේ අධ්‍යාපනයේ දියුණුවත් සමඟ බොහෝ තරුණ පිරිස් තම රැකියාව අධ්‍යාපන මට්ටමට අනුව තෝරාගනු ලබන අතර එම නිසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයට යොමු වී ඇති පිරිස ඉතා අල්ප වේ. කෘෂි ආර්ථිකය මත ශක්තිමත්ව පවත්වාගෙන ආ ඥාති සබඳතාවලට මේ නිසා බලපෑමක් සිදු විය. එපමණක් නොව රැකියාව හේතුවෙන් ගමෙන් පිට වී යන පිරිස වැඩි වී තිබීම නිසා සක්‍රීය ඥාති සබඳතා පැවැත්වීම අවම මට්ටමක් ගෙන ඇත.

ලීච් අධ්‍යයනය කළ කාලයේ දී ඥාති සබඳතා බොහෝ විට ස්ථාවරත්වයකින් සහ අඛණ්ඩතාවකින් යුතුව පැවතිණි. සමාජයේ පැවති ඥාති කණ්ඩායම්වල පුද්ගලයන් හට එකිනෙකාට පැහැදිලිව නිර්වචනය කරන ලද භූමිකා සහ වගකීම් සමූහයක් පැවතිණි. ඒ සඳහා ඥාති පද මූලික විය. පවුල් ඒකකයක විශාල පිරිසක් එකට ජීවත් වූ අතර සාමාන්‍යයෙන් පරම්පරා ගණනාවක් එම නිසා එක් පවුලක දැකගත හැකි විය. මෙමගින් සමාජ සහයෝගය, සම්පත් බෙදා ගැනීම සහ ප්‍රජා සහජීවනය සමාජයෙහි ස්ථාපිත වී තිබිණි. විවාහ මගින් මෙම සබඳතා තව තවත් ශක්තිමත් කර ගැනීම සිදු විය. නමුත් න්‍යෂ්ටික පවුල් ක්‍රමයේ වර්ධනයත් සමඟ විස්තෘත පවුල් ස්වභාවය සමාජයෙන් ඉවත් වී ගොස් ඇත.

සමකාලීන සමාජයේ ගෝලීයකරණය, නාගරීකරණය සහ වෙනස් වන සමාජ සම්මතයන්ට අනුව සාම්ප්‍රදායික විස්තෘත පවුල් ආකෘතිය න්‍යෂ්ටික පවුල් ආකෘතියට මාරු වී ඇත. බොහෝ දෙනෙකු තම ඥාතීන්ගෙන් වෙන්ව ජීවත් වෙති. ඥාති සබඳතා පිළිබඳ ඉදිරිපත් වූ අදහස් අතර **"ඥාති එක්ක නම් අපේ වැඩි සම්බන්ධකමක් නෑ." "තමන්ගෙ වාසියට විතරයි." "ඥාතීන්ට වඩා අල්ලපු ගෙදර මිනිස්සු හොඳයි."** යන ඒවා ප්‍රධාන තැනක් ගනියි. මෙම වෙනස නිසා චිත්තවේගීය බැඳීම් වර්තමානයේ බොහෝ විට ජීව විද්‍යාත්මක සම්බන්ධතාවලට වඩා ප්‍රමුඛත්වයක් ගනී.

එමෙන්ම එක් අතකින් ඥාති සබඳතා පවත්වා ගැනීමේ දී නව තාක්ෂණයේ දායකත්වය සැලකිය යුතු මට්ටමක ඇත. සමාජ මාධ්‍ය සහ දූරකථන මගින් දුර සාධකය සහ භූගෝලීය සීමා නොසලකා පවුලේ සාමාජිකයන් සමඟ ඥාති සම්බන්ධතා පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. නමුත් "ගම අතහැර වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වූ දරුවන් නැවත ගමට පැමිණීම සීමා කිරීම" තාක්ෂණය නිසා සිදුවී ඇති බව බොහෝ ගම්වාසීන්ගේ අදහසයි. කෙසේ වෙතත්, මෙය සාම්ප්‍රදායික ඥාති සබඳතාවල ගතිකත්වයක් නිර්මාණය කරන බව ප්‍රකාශ කළ හැකි ය.

පොදුවේ සලකා බලන විට නියැදියේ වැඩි දෙනෙකුගේ අදහස් වූයේ වර්තමානයේ දූරස්ථ ඥාති සම්බන්ධතා අක්‍රීය වී ඇති බවයි. එමෙන් ම සමීප ඥාති සම්බන්ධතා ද ලිහිල් වී ඇති බව සියලු ම දෙනාගේ පොදු අදහස විය. විශේෂයෙන් ද්වාරකර්ම අවස්ථාවල දී පවා අතීතයේ මෙන් ඥාතීන් සියලු දෙනා එකතු වීමක් සිදු නොවේ. වර්තමාන සමාජයේ අවිවේකී, තරගකාරී ජීවන රටාව නිසා ඥාති සබඳතා පමණක් නොව සාමාන්‍ය ගම්වාසීන් අතර ඇති සුහදත්වය ද දුරස් වී ඇත.

## 4. නිගමන හා යෝජනා

ඊ. ආර්. ලීච් විසින් රචනා කරන ලද පුල් එළිය (1961) ග්‍රන්ථයට පසු විපරමක් ලෙස සිදු කළ මෙම පර්යේෂණයෙන් එළඹිය හැකි නිගමන කිහිපයකි. ක්ෂේත්‍ර පර්යේෂණය සිදු කළ පුල් එළිය සහ කලවැල්පතාන, ලීච්ගේ අධ්‍යයනයට ලක් වූ කාල වකවානුව වන විටත් සම්ප්‍රදායික සිංහලයේ නුවර කලාවිය අනන්‍යතාව හොඳින් නිරූපණය කළ ගම් ප්‍රදේශයකි. නමුත් වර්තමානයේ එම ග්‍රාමීය ලක්ෂණ කෙමෙන් වෙනස් වෙමින් අර්ධ නාගරික ලක්ෂණ පෙන්නුම් කරමින් පවතියි. ඒ ස්වභාවය මෙම අධ්‍යයන ප්‍රදේශයේ වත්මන් පවුල් ඒකකයක සිටින සාමාජික සංඛ්‍යාව සහ නවීකරණය නිසා ශීඝ්‍ර ලෙස වෙනස් වන පවුලේ සමාජ, සංස්කෘතික හා ආර්ථික පසුබිමෙන් පිළිබිඹු වෙයි. අතීතයේ සම්පූර්ණයෙන් ම වාගේ විස්තෘත පවුල් ක්‍රමය ක්‍රියාත්මක වූ මෙහි වැඩි වශයෙන් න්‍යෂ්ටික පවුල් දක්නට ලැබෙයි. යම් ප්‍රමාණයකට සංකීර්ණ න්‍යෂ්ටික පවුල් ද ඇත. එමගින් අන්තර් පරම්පරා සම්බන්ධතා ගිලිහෙමින් පවතියි. සන්නිවේදන තාක්ෂණ නවීකරණයත්, සමාජ මාධ්‍ය භාවිතය ශීඝ්‍රයෙන් වර්ධනය වීමත් සමග විසරණය හරහා බටහිර හා ඉන්දීය සංස්කෘතීන්වල ආභාසය වැඩි වී ඇත. සමාජය තුළ අතීතයට සාපේක්ෂව විශාල තරගකාරීත්වයක් නිර්මාණය වී ඇත. ඒ හේතුවෙන් කුලය, ඉඩම් භුක්තිය, විවාහය මෙන් ම ඒවා එකිනෙක බැඳ තබන ඥාතිත්වය කෙරෙහි මේ ගැමියන්ගේ වැඩි නැඹුරුතාවක් නොමැත.

අධ්‍යයන ප්‍රදේශයේ අධ්‍යාපනය සඳහා වැඩි නැඹුරුතාවක්, වැඩි ප්‍රවණතාවක් පැවතුණ ද, වැඩිහිටියන් ද තම දරුවන්ට විධිමත් අධ්‍යාපනයක් ලබා දීමට උනන්දුවක් දැක්වුව ද බහුතරයක් සාමාන්‍ය පෙළ හෝ ඊට පහළ ශ්‍රේණිවලින් අධ්‍යාපනය හමාර කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් තරුණයන් කෘෂිකර්මාන්තයෙන් බැහැරවීම හා අධ්‍යාපනය මග දී කඩාකප්පල් වූවන් සඳහා වෙන් වූ සුළු වැටුපක් සහිත රැකියා සඳහා ගමෙන් පිටවීම සහ රැකියා සඳහා විදේශගත වීම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.

අධ්‍යයන ප්‍රදේශයේ වයස් පිරමීඩයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය නම් වයස අවුරුදු 55 – 70 අතර වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ අගයක් ගනියි. නමුත් ප්‍රදේශයේ ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තයේ දායකත්වය එතරම් සාර්ථක මට්ටමක නැත. එමෙන් ම ඥාතිත්ව බැඳීම් ලිහිල් වීම නිසා වැඩිහිටියන් හා තරුණයන් අතර සම්බන්ධය එතරම් යහපත් මට්ටමක නොතිබීම මේ තත්ත්වය තවදුරටත් තීව්‍ර කර ඇත. සම්ප්‍රදායික සිරිත් හා තහංචි ක්‍රියාත්මක වූයේ විවාහය, ඉඩම් භුක්තිය වැනි සංකල්ප සමග ය. නමුත් සාම්ප්‍රදායික විවාහ සහ පවුල් සම්බන්ධතා වෙනස් වී යෝජිත හා ප්‍රේම සබඳතා මඟින් සිදුවන විවාහ වර්ධනය වී ඇත. වර්තමානයේ නීතියේ ආධිපත්‍යය පැවතුණ ද සිරිත් සහ තහංචි මගින් අතීතයේ සිදු වූ සමාජ පාලනය තරම් සාර්ථක නැත. විවාහයේ දී අතීතයේ මෙන් කුලය ගැළපීම, ජාතිය, ආගම මෙන් ම ඥාතිත්වය පිළිබඳ සලකා බැලීම ද නොසලකා හැර ඇත. එය ඇවැස්ස ඥාති විවාහය හා ඉඩම් භුක්තිය පිළිබඳව පැවති චාරිත්‍ර-වාරිත්‍ර සමාජයෙන් ඉවත් වී යාමට එය හේතුවක් වී ඇත. ඒ හරහා සිරිත, සම්ප්‍රදාය නොසලකා හැරීම වැඩි වීම නිසා සමාජ ගැටලු ඇති වීමේ වැඩි ප්‍රවණතාවක් ඇත.

මේ ආකාරයට බටහිරකරණය, වාණිජකරණය, නවීකරණය, නාගරීකරණය වැනි සංසිද්ධි නිසා සිදු වී ඇති සමාජ සංස්කෘතික වෙනස් වීම මඟින් ඥාති සම්බන්ධතා ගිලිහී යාම, මූල්‍ය වටිනාකමට මුල් තැන දීම, ධර්මතා සහ තහංචි නොසලකා හැරීම මගින් සමාජයේ පැවති ඒකාබද්ධතාව, සමාජ පැවැත්ම හා පාලනය ගිලිහී ගොස් ඇත. අධ්‍යයනය ආරම්භයේ දී පර්යේෂණ ගැටලුව වශයෙන් තබාගත් එම කාරණය ඉහත විවරණයෙන් මනා ලෙස පැහැදිලි වේ.

ඥාතිත්වය සංකල්පය සමාජයක පවතින ප්‍රධාන සමාජ අංග පවත්වා ගැනීමට අතීතයේ ක්‍රියාත්මක වූ ආකාරය සහ වර්තමානයේ එහි සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ සිදු කළ මානව විද්‍යාත්මක අධ්‍යයනය අවසානයේ ඉදිරිපත් කළ හැකි යෝජනා කිහිපයක් මෙසේ දක්වාලිය හැකි ය. ඥාතිත්ව සංකල්පය මඟින් පවත්වාගත් සමාජ ඒකාබද්ධතාව නැවත සමාජයේ ඇති කිරීමට හා එහි වටිනාකම පිළිබඳ සමාජයට පණිවිඩ ලබා දීමට ඉදිරිපත් කළ හැකි යෝජනා මේ යටතේ විග්‍රහ වනු ඇත.

ඒ අනුව ගමෙහි ඉතිහාසය මෙන් ම පරම්පරානුගතව පැවත එන භූමි පිළිබඳව හා එහි වටිනාකම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. එමෙන් ම පැරණි භූමි සුරැකීම නවීන නීති රීති සමග ඒකාබද්ධව සිදු කිරීම වැදගත් වේ. තරුණ පරපුරට ගැමි භූමි හා කෘෂිකර්මය සම්බන්ධයෙන් උනන්දුව ඇති කරන වැඩසටහන් සැලසුම් කළ යුතු ය. එනම් තරුණ පරම්පරා අතර තිරසර ගොවිතැන, සංස්කෘතික සංරක්ෂණය පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම වැදගත් ය. තරුණ පරපුර හා වැඩිහිටියන් අතර අන්තර්සබඳතාව වැඩි කිරීම සඳහා සමාජශීලී වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. ගමෙහි පන්සලේ පවත්වන උත්සවවලට, ගමෙහි පවත්වන පොදු වැඩවලට තරුණ තරුණියන්ගේ සහභාගීත්වය වැඩි කිරීමට පියවර ගැනීම මෙහි දී සිදු කළ හැකි ය. ආර්ථිකය කෘෂිකර්මය මත පදනම් වූ නමුත් අද එය විවිධ වී ඇත. එය සැලකිල්ලට ගෙන කුඩා ව්‍යාපාර, කෘෂි නිෂ්පාදන හා ඒ මගින් ගැමි ආර්ථිකය නැවත ගොඩ නැංවීම මෙන් ම විදේශ සේවාවෙන් ආපසු පැමිණෙන පවුල් සඳහා ආර්ථික නැවත පිහිටුවීමේ සහන වැඩසටහන් ද ක්‍රියාත්මක කළ යුතු ය.

සාම්ප්‍රදායික සමාජ සංස්කෘතික වටිනාකම පිළිබඳව නව පරම්පරා දැනුම්වත් කිරීම මඟින් ඥාතීත්වය නොනැසී දිගින් දිගටම පවත්වා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර දීමට පියවර ගැනීම, දේශගුණික අභියෝගවලට මුහුණ දීම සඳහා නවීන ජල සංරක්ෂණ ශිල්පීය ක්‍රම ඒකාබද්ධ කිරීමෙන් සාම්ප්‍රදායික වාරිමාර්ග පද්ධති ශක්තිමත් කිරීම හා එමඟින් තිරසර ජල කළමනාකරණයකට හා කිරීමට කටයුතු සැලසීම, ආර්ථික වශයෙන් පහළ මට්ටමක පසුවන පවුල්වල සාමාජිකයන්ව විකල්ප ආදායම් මාර්ග කරා යොමු කරවීමට කටයුතු කිරීම මගින් විදේශගතවීම් අවම කරගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඥාතිත්ව රටා ශක්තිමක් කිරීමට සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පහසුකම් සැලසීම මෙන් ම නවීන මාධ්‍ය ඒ සඳහා යොදා ගැනීම ද කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ගුණවර්ධන, ඩී. එස්. ඩබ්. (2014). කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය පිළිබඳ මානව විද්‍යාත්මක විග්‍රහයක්. *Journal of Social Sciences, 01*, pp. 135-152.

http://repository.rjt.ac.lk/bitstream/handle/123456789/1379/135-152.pdf?Sequence=1 &isAllowed=y

රයන්, බී. (2015). *සිංහල සමාජයේ කුල ක්‍රමය* (චන්ද්‍ර ශ්‍රී රණසිංහ පරි.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සමරසේකර, එස්. (2005). *මානව විද්‍යා මූලධර්ම.* කර්තෘ ප්‍රකාශන.

Caldwell, B. (1992). *Marriage in Sri Lanka: a century of change*. http://hdl.handle.net/1885/123190

Codrington, H. (1938). *Ancient land tenure and revenue in Ceylon*. The Ceylon Government Press.

Leach, E.R. (1961). *Pul Eliya: a village in Ceylon, a study of land tenure and kinship*. Cambridge University Press. New York.

Mahamadachchi, N. D. (2019). Pul Eliya re-visited: a case study of agrarian change *kln*. https:// www.academia.edu/27176050/PUL_ELIYA_RE_VISITED_A_CASE_STUDY_OF_ AGRARIAN_CHANGE

Malinowski, B. (1929). Practical Anthropology. *Africa*, *2*(1), 22–38. Practical-Anthropology-1-3.pdf

Mapa, R., Kumaragamage, D., Wdl, G., & Dassanayake, A. (2002). Land use in Sri Lanka: past, present and the future. *ResearchGate*. (PDF) Land use in Sri Lanka: past, present and the future

Riswan, M. (2014). A historical survey of social class and caste system in Sri Lanka. *KALAM International Journal of Faculty of Arts and Culture, South Eastern University of Sri Lanka*, 8(1), 40–47. https://www.seu.ac.lk/researchandpublications/kalam/vol8/5%20KALAM%20VIII%20(1)%202014%20 %20(Page%2040-47).doc14.11.2014-3.pdf.

Stein, B. (1968). Land Tenure in Village Ceylon: A Sociological and Historical Study. By Gananath Obeyesekere. [Cambridge South Asian Studies.] (New York: Cambridge University Press. 1967. Pp. xi, 319.). *The American Historical Review*. Sci-Hub | The American Historical Review | 10.1086/ ahr/73.3.889

Yalman, N. (1971). *Under the Bo Tree: studies in caste, kinship, and marriage in the interior of Ceylon.* University of California. Berkeley.